



# මැන්ගුස් ගසට "උප්පැන්න සහතිකයක්"

ජ්‍යෙෂ්ඨ විභාගයෙන් උසස් ලෙස සමත්වූ මට, අපේ හිතවතෙකුගෙන් ලැබුණු තෑගී බෝග අතර මැන්ගුස් පාර්සලයක්ද විය. එහි මැන්ගුස් ගෙඩි හතරක් තිබුණු අතර ඒවා අප නිතර දැක තිබුණු මැන්ගුස් ගෙඩි වලට වඩා තරමක් විශාල බව පෙනුනි. පියාගේ මිතුරෙකු වූ එම හිතවතා, අප ප්‍රදේශයේ ඒ දිනවල ආරම්භ කරන ලද ආදර්ශ ගොවිපළේ කළමණාකරුය. පාර්සලය මා අතට දුන් ඔහු, එම මැන්ගුස් ගෙඩි හා සම්බන්ධ රසවත් කතාවක්ද කිවේය. ඔහුගේ වචන වලින්ම කතාව මෙසේය

"අපේ ගොවිපළ පටන්ගත්තේ ලංකාවට නිදහස ලැබී දෙවන සංවත්සරය තිබුණු 1950 වසරේ පෙබරවාරි හතර වෙනිදා. ඒ උත්සවයේ මුලාසනය දැරුවේ අගමැති ඩී. එස්. සේනානායක මැතිතුමා. එම උත්සවයේදී බලාපොරොත්තු වුයේ අලූත් ගොවිපළේ පලතුරු ගස් විශාල ප්‍රමාණයක් රෝපණය කිරීමයි. අගමැති තුමා විසින් සිටවනු ලබන මුල්ම පලතුරු පැළය සඳහා අපට කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මැලේසියාවෙන් බීජ ගෙන්වා පැළ කරන ලද මැන්ගුස් පැළයක් ලැබුණා. ගොවිපළේ රෝපණය කරන ලද පළමුවෙනි පලතුරු ගස මෙයයි"

"අවුරුදු හතකට පස්සේ මේ මැන්ගුස් ගස පීදිලා ගෙඩි හත අටක් හටගත්තා. මේ ගෙනාවේ එයින් ගෙඩි කිහිපයක්."

මේ අතීත කථාව අසා අපට මහත් සතුටක් ඇතිවිය. එසේම ශ්‍රී ලංකාවේ දෙවැනි නිදහස් දින සැමරුම පෙරදැරි කර, අගමැතිතුමා විසින් රෝපණය කරන ලද මැන්ගුස් ගසෙහි නෑඹුල් ගෙඩි වලින් කිහිපයක්, අපටද ලැබීම මහත් භාග්‍යරයක් ලෙස දැනුණි.

"ඔය ගෙඩි වල ඇට ඇති. ඒවා පැළ කරන්න" කී ඔහු මැන්ගුස් ඇට හොඳින් සෝදා පිරිසිදු කර දින කිහිපයක් අව්වේ වේලා, දිරා යන තෙතමනය සහිත පොල් ලෙල්ලක රෝපණය කළ විට මාස දෙකකදී පමණ බීජ පැළ හටගන්නා බව තවදුරටත් විස්තර කළේය.



දැන් එය රුස්ස ගසක් වී තිබේ.

ලැබුණු මැන්ගුස් ගෙඩි සතරෙන් තුනක හොඳින් පරිණත වූ බීජ පහක් තිබුණු අතර අනික් ගෙඩියේ බීජ නොතිබුණි. ගොවිපළ කළමණාකාර මාමාගෙන් ලැබුණු උපදෙස් පරිදි මැන්ගුස් බීජ රෝපණය කළෙමි. මාසයකදී පමණ ඒවා ප්‍රරෝහණය වී පැළ හට ගත්තේය.

මේ අතර, ශිෂ්‍යත්ව ධාරියෙකු වූ, මා උගත් විදුහලේ උසස් පෙළ විද්‍යා පන්තිය සඳහා අවශ්‍ය ගුරුවරු හිඟ වීම නිසා මට උසස් පෙළ ඉගෙනීම සඳහා වේයන්ගොඩ මධ්‍ය විද්‍යාලයට යාමට සිදුවිය.




නව විදුහලේ නේවාසිකව සිටි මට, රටේ විවිධ ප්‍රදේශවලින් පැමිණ සිටින මිතුරන් රාශියක්ම හඳුනා ගැනීමට හැකි විය. අපට උසස් පෙළට ඉගැන්වීමට ද්‍රවිඩ ගුරුවරුද කිහිප දෙනෙක් සිටියහ. ශිෂ්‍ය නිවාසයේම නතර වී සිටි කුගදාසන් සර් අපට උද්භිද විද්‍යාව සහ සත්ත්ව විද්‍යාව උගන්වන ගුරුවරයා විය. ඔහු බොහෝ ප්‍රායෝගික අත්දැකීම් සහිත දක්ෂ ගුරුවරයෙක් විය.

ශ්‍රී ලංකාවට නිදහස ලැබී දස වසරක් සම්පූර්ණ වන 1958 වසරේදී රටතුළ, නිදහස සැමරීමේ විවිධ උත්සව රාශියක් සංවිධානය කර තිබිණ. අධ්‍යාපන අමාත්‍යංශයද, පාසල්වතු අලංකරණය, භෝග නිෂ්පාදනය වැනි කටයුතු කරන ලෙස විදුහල්වලට දන්වා තිබිණ. වර්ෂය මුලදීම විද්‍යා සිසුන් ඇමතූ කුගදාසන් සර්, පාසල්වතු අලංකරණය තේමාව යටතේ උද්භිද උයනක් සකස් කිරීමට යෝජනා කළේය.

මේ සඳහා ශිෂ්‍ය නිවාසයටත් විද්‍යාගාරයටත් අතර බිම් කොටස සුදුසු බව තීරණය විය. එම බිම් කොටස හෙළි පෙහෙළි කරන විට එහි පැමිණි විදුහල්පතිතුමාද එය ඉතා අගනා අදහසක් බව අනුමත කර, යෝජිත බිම් කොටස වෙන් කිරීම සඳහා කම්බි වැටක් තැනීමට අවශ්‍යම ද්‍රව්‍ය සහ ගේට්ටුවක්ද සැපයිය හැකි බව කියා අප සැම තවත් දිරිමත් කළේය.

මුලික වැඩ අවසන් කළ පසු, කුගදාසන් සර්ගේ උපදෙස් අනුව උද්භිද උයන තුළ, ජලජ පරිසරයක්, ශුෂ්ක පරිසරයක්, අපිශාක, පරපෝෂිත ශාක, භූගත කඳන් සහිත ශාක, විවිධ ආරෝහක ශාක, මීමන, ඕකිඩ්, බාඳුරා වැනි සුවිශේෂ ශාක වැවිය හැකි ස්ථාන, ඒ ඒ ශාක වලට ගැලපෙන පරිදි සකස් කරණ ලදී. විදුහල් භූමියට ආසන්නයෙන්ම දිවෙන උඩරට දුම්රිය මාර්ගය පැත්තේ හොඳින් ආලෝකය වැටෙන කොටසේ, විශාල වෘක්ෂ ලෙස වැඩෙන, ප්‍රදේශයේ බහුලව නොමැති පලතුරු ශාක කිහිපයක්ද රෝපණය කිරීමට තීරණය විය.